// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2003/6 - 2017 ජනවාරි මස 24 වැනි අඟහරුවාදා - 2017.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරීම

2013 අංක 1 දරන දිවිනැගුම පනතේ 3(1) වගන්තිය යටතේ දිවිනැගුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙසට පත්කරනු ලැබ ඇති නීල් බණ්ඩාර හපුහින්න වන මම, එම පනතේ 3 (2) වගන්තියේ විධිවිධානවලට අනුව දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ඔවුන්ගේ පරිපාලන බල ප්‍රදේශ තුළ දිවිනැගුම පනතේ විධිවිධාන, කාර්යයන් හා කර්තව්‍යන් ක්‍රියාත්මක කිරීම සඳහා බලය පවරමි.

මෙම බලතල ක්‍රියාත්මක කිරීමේ දී මාගේ උපදෙස් හා විධානයන්ට අතිරේකව, දිවිනැගුම පනතේ 38 වන වගන්තියෙන්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයකු ලෙසට පත්කර ඇති ඔබගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අයත් පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති/අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ සාමාන්‍ය පරිපාලනයට ද ඔබ යටත්වනු ඇත.

නීල් බණ්ඩාර හපුහින්න,
අධ්‍යක්ෂ ජනරාල්,
දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව.

02 - 331